ජාතිය ගොඩනැගීමේ හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය

# ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරිය

## ගැටඹේ පේරාදෙණිය

**ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරියේ පහත සඳහන් තනතුර සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

## සිවිල් ඉංජිනේරු - තනතුරු 01

(I) පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් විද්‍යාවේදී (සිවිල් ඉංජිනේරු) උපාධියක් සමග සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ වසර 08 පළපුරුද්ද

හෝ

(II) වරලත් ඉංජිනේරු ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය සමග සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ වසර 10 ක කළමනාකරණ මට්ටමේ පළපුරුද්ද.

**වැටුප් පරිමාණය :** රු. 25,640/- 3 x 665/- 7 x 735/- 15 x 925/- 46,655/-

**පොදු කොන්දේසි :**

1. ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරියේ බල ප්‍රදේශය වන මධ්‍යම සබරගමුව, ඌව සහ නැගෙනහිර පළාතේ අම්පාර දිස්ත්‍රික්කයේ පදිංචි අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛත්වයක් දෙනු ලැබේ.
2. අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 45 ට අඩුවිය යුතු අතර, රාජ්‍ය අංශයේ හා ව්‍යවස්ථාපිත මණ්ඩල වල සේවකයින් සඳහා මෙම වයස් සීමාව බල නොපානු ඇත.
3. සේවක අර්ථ සාධක අරමුදල සඳහා සේවකයාගේ දායකත්වය 8% ක් වන අතර සේවක අර්ථ සාධක අරමුදල සහ සේවා නියුක්ත භාරකාර අරමුදලට අධිකාරියේ දායකත්වය පිළිවෙලින් 12% සහ 3% වේ.
4. අයදුම්පත් 2009 ජූලි මස 17 වන දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම් හා දුරකථන අංක සහිතව ලියාපදිංචි තැපැලෙන් පහත සඳහන් ලිපිනයට එවිය යුතුය.
5. කවරයේ වම් ඉහළ කෙළවරේ "**සිවිල් ඉංජිනේරු තනතුර සඳහා අයදුම්පත**" යනුවෙන් පැහැදිළිව සඳහන් කළ යුතුය.
6. අයදුම්පත්වල අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද යනාදිය පිළිබඳ සම්පූර්ණ විස්තර ඇතුලත් විය යුතු අතර අදාළ සහතිකවල පිටපත් ඒ සමග එවිය යුතුය.
7. රාජ්‍ය අංශයේ හා ව්‍යවස්ථාපිත මණ්ඩල වල සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත අදාළ ආයතන/දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.
8. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පසුව ලැබෙන සියලු අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**අධ්‍යක්ෂ ජනරාල්,**
**ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරිය,**
**ගැටඹේ, පේරාදෙණිය.**